ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

**60 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2024(2025 ජනවාරි)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025 ஜனவரி)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2024 (January 2025)

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

10 ශ්‍රේණිය
*Grade 10*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**උපදෙස් :** * ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නදුනි ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධිධාරිණියක් වූ අතර ඇය විසින් 2024 අප්‍රේල් 01 දින කුරුණෑගල නගරයේ කුලියට ගත් ගොඩනැගිල්ලක "රන්තරු ෆැෂන්" නමින් නිමි ඇඳුම් අළෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එදින ප්‍රාග්ධනය ලෙස මුදලින් රු. 1,000,000 ක් ද රු. 200,000ක් වටිනා සාප්පු උපකරණ යොදවන ලදි. ව්‍යාපාරය පාසල් අවට තිබීම නිසා පාසල් නිමි ඇඳුම් අලෙවි කිරීමට ඇයට වැඩි අවස්ථාවක් හිමිවිය. 2024 අප්‍රේල් මස රන්තරු ෆැෂන් ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදු විය.

| | |
|---|---|
| නිමි ඇඳුම් අත්පිට ගැණුම් | රු. 400,000 |
| උපකරණ ගැණුම් | රු. 100,000 |
| අත්පිට විකුණුම් | රු. 76,000 |
| ගෙවූ බැංකු පොලී | රු. 2,000 |
| විදුලි ගාස්තු | රු. 10,000 |
| ගෙවූ වෙනත් වියදම් | රු. 16,000 |
| නිමි ඇඳුම් ණයට ගැණුම් | රු. 80,000 |

2024 අප්‍රේල් 30 වන විට රු. 40,000ක නිමි ඇඳුම් තොගයක් ව්‍යාපාරය සතුව පැවතුණි. 2024 මැයි 01 දින සිට ව්‍යාපාරයට නව හවුල් කරුවෙකු ලෙස සාමා බඳවා ගැනීමට තීරණය කරන ලදි. ඇය විසින් ව්‍යාපාරයට රු. 150,000 යොදවන ලද අතර එතැන් සිට "සළු පිළි මන්දිරය" නමින් පවත්වාගෙන යන ලදි. මාසික ගොඩනැගිලි කුලිය රු. 30,000ක් ගෙවිය යුතුව ඇත.

**(i)** අ. නදුනි විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද?
ආ. රන්තරු ව්‍යාපාරය සතු ශක්තීන් හා අවස්ථාවක් ලියන්න.

**(ii)** අ. "රන්තරු ෆැෂන්" ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද ? හේතු දක්වන්න.
ආ. රන්තරු ෆැෂන් ව්‍යාපාරයට ලියාපදිංචි කිරීමෙන් නෛතික පුද්ලභාවයක් හිමිවේ ද ? නොවේ ද ? යන්න දක්වන්න.

**(iii)** "රන්තරු ෆැෂන්" ව්‍යාපාරයට සහය කිරීම "සළු පිළි මන්දිරය" වාසි දායක වේ. එම ප්‍රකාශය සනාථ කිරීමට හේතු දෙකක් දක්වන්න.

**(iv)** "සළු පිළි මන්දිරය" ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා බලපාන නීතිය කුමක් ?

**(v)** 2024 අප්‍රේල් 01 දින "රන්තරු ෆැෂන්" ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණ අගයන් සහිතව ලියා දක්වන්න.

**(vi)** රු. 80,000ක නිමි ඇඳුම් ණයට ගැණුම් වාර්තා කිරීමට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න.

**(vii)** ඉහත සිද්ධියේ හඳුනාගත හැකි ජංගම නොවන වගකීම් හා ජංගම වගකීම් අගයන් සහිතව ලියා දක්වන්න.

**(viii)** 2024 අප්‍රේල් 30 දිනට මුදල් පොත පිළියෙල කරන්න.

**(ix)** 2024 අප්‍රේල් 30 දිනට මුළු වගකීම් වල වටිනාකම ලියා දක්වන්න.

**(x)** මෙම ව්‍යාපාරයේ ගිණුම්ගත කිරීමට අදාල උපයෝගි පොත් 2ක් හා ඊට අදාල මුලාශ්‍ර ලේඛණ නම් කරන්න.

(ලකුණු 02 x 10 = 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.)

02. (i) අ. නිෂ්පාදක සාධක යන්න අර්ථ දක්වන්න.
ආ. ව්‍යවසායකයා විසින් ඉටු කරන කාර්යයන් දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
අ. ව්‍යාපාරයකට ඇල්මැති පාර්ශවයක් ලෙස සේවකයන්ගේ අරමුණු වන්නේ රැකියා සුරක්ෂිත බවයි.
ආ. නිෂ්පාදන කාර්යයේ දි යොදා ගන්නා කර්මාන්ත ශාලාව නිෂ්පාදක සාධකයක් වන භූමියට අයත්වේ
ඉ. ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව, යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රමාණය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ද යන්න හඳුනා ගනියි.
ඊ. ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුලින් එම ව්‍යාපාරයට ඇති අවස්ථා හා තර්ජන හඳුනාගත හැකිය. (ලකුණු 02 යි)

(iii) අ. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවෙන වාසි 02ක් දක්වන්න.
ආ. පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා රජය පිහිටුවා ඇති ආයතනය නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) නිර්මාණශීලි පුද්ගලයෙක් වූ විකුම් අලිගැට පේර ඇට වලින් මාස 10ක කාලයක් පාවිච්චි කල හැකි නිර්මාණයට අත්හදා බැලීමක් කරයි. ඒ සඳහා නවීන්ගේ සහය ලබා ගනී. උපකරණ ගැනීමට රු. 20,000ක ප්‍රාග්ධනයක් යොදවා ඇත.
අ. මෙහි ඇතුලත් කල යුතු නිෂ්පාදක සාධක 2ක් උදාරහරණ සහිතව දක්වන්න.
ආ. අයිතිකරු වූ විකුම්ගේ අරමුණු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)
**(මුළු ලකුණු 08 යි)**

03. (i) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දීමට සිටින පහනගේ ජාතික හැඳුනුම්පත තවමත් ලැබී නොමැති අතර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව කඩිනම් කර නිකුත් කරන බව ප්‍රවෘත්ති ප්‍රකාහය මගින් දැනුම් දී ඇත. ජාතික හැඳුනුම්පත අවශ්‍ය බව විභාග දොපර්තමේන්තුව නිවේදනයක් නිකුත් කර ඇත.
අ. මෙහි සඳහන් සංවිධාන වර්ගයක් නම් කර අරමුණු අනුව කවර වර්ගයකට අයත්දැයි දක්වන්න.
ආ. ඔබ සඳහන් කළ සංවිධාන වර්ගයේ පහත ලක්ෂණ කවරේදැයි දක්වන්න.
පැවැත්ම -
අයිතිය. - (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
අ. හිමිකාරිත්වය අනුව ව්‍යාපාර පෞද්ගලික හා පොදු ලෙස අංශ දෙකකට බෙදා දක්වයි.
ආ. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම ලාභ අපේක්ෂිත ව්‍යාපාර වල අරමුණ වේ
ඉ. රාජ්‍ය සංස්ථාවක් උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.
ඊ. සමාගමක් විසින් සමාගම් පණතට අනුව කටයුතු කිරීම නෛතික පරිසරයට අයත් වේ. (ලකුණු 02 යි)

(iii) අ. ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි නිර්ණායක දෙකක් සඳහන් කරන්න.
ආ. සමුපකාර සමිතිවල දැකි හැකි සුවිශේෂි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) අ. "ව්‍යාපාර සංවිධානයක්" යන්න කෙටියෙන් හඳුන්වන්න.
ආ. පහත දැක්වෙන ව්‍යාපාර, හිමිකාරිත්වය අනුව වර්ග කර දක්වන්න.
**A -** සී/ස මන්දිරා සමාගම
**B -** අධ්‍යාපන සේවකයින්ගේ සමූපකාර සමිතිය
**C -** ජාතික ඉතිරිකිරීමේ බැංකුව
**D -** ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව (ලකුණු 02 යි)
**(මුළු ලකුණු 08 යි)**

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.)

04. **(i)** ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය අලෙවිකරණ දුෂ්මන්තගේ ව්‍යාපාරයේ 2024 ජුනි මාසයේ මුල් දින කිහිපයක් තුළ සිදුවූ ගනුදෙනු වලට අදාලව ගිණුම් තබන්නා විසින් සකස් කළ ගිණුම්කරණ සමීකරණය පහත දී ඇත.

| **ගනුදෙනුව** | **වත්කම්** | | | | = | **හිමිකම්** | + **වගකීම්** | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොඩනැගිලි | උපකරණ | තොගය | ණයගැතියෝ | මුදල් | ප්‍රාග්ධනය | බැංකු ණය | ණයහිමියෝ |
| 2024.06.01 ශේෂය | 100,000 | 50,000 | 87,000 | 8,800 | 53,200 | 160,000 | 75,000 | 64,000 |
| 01 | | + 25,000 | | | | + 25,000 | | |
| 02 | | | - 15,000 | + 16,500 | | + 1,500 | | |
| 03 | | | + 43,000 | | | | | + 43,000 |
| 04 | | | | | - 1,000 | - 1,000 | | |
| **එකතුව** | | | | | | | | |

ව්‍යාපාරයේ අයිතිකරු විසින් මුදල් හෝ භාණ්ඩ කිසිවක් ගැනිලි ලෙස සිදුකර නැත.

**ඔබ විසින්,**

අ. ඉහත ගිණුම්කරණ සමීකරණයේ දක්වා ඇති එක් එක් ගනුදෙනුව වටිනාකම සහිතව ලියා දක්වන්න.

ආ. ගනුදෙනු අවසානයේ දුෂ්මන්තගේ ව්‍යාපාරයේ පහත අයිතම වල වටිනාකම සොයන්න.

- **i.** ජංගම නොවන වත්කම්
- **ii.** ජංගම වත්කම්
- **iii.** හිමිකම
- **iv.** ජංගම වගකීම්

(ලකුණු 04 යි)

**(ii)** සිරිමල්ගේ ව්‍යාපාරයේ 2024 මාර්තු මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

2024

03/01 රු. 30,000ක් තැන්පත් කර ජංගම ගිණුමක් විවෘත කළා.

03/05 ණයගැතියකුගෙන් චෙක්පතක් ලැබුණා රු. 2,000 යි.

03/08 ණයහිමියන්ට චෙක්පතකින් ගෙව්වා රු. 3,000 යි.

03/12 ඉන්වොයිස් අංක 12 මලින්දගෙන් ණයට ගැණුම්
එකක් රු. 75 බැගින් තනි රූල් පොත් දුසිම් 02
එකක් රු. 100 බැගින් සී.ආර්. පොත් දුසිම් 05
(අඩු කළ වට්ටම 10%)

03/14 රු. 12,000ක් බැංකුවේ තැන්පත් කළා.

03/18 ඉන්වොයිස් අංක 36 සමරක්කොඩිගෙන් ණයට ගැණුම්
කිලෝවක් රු. 220 බැගින් සම්බා හාල් 50Kg
කිලෝවක් රු. 600 බැගින් පරිප්පු 30Kg

03/20 3/5 දින ලද චෙක්පත බැංකුවේ තැන්පත් කළා.

03/25 බැංකුවෙන් ආපසු ගත්තා රු. 8,000

03/27 ඉන්වොයිස් 48 නිරිඇල්ලගෙන් ණයට ගැණුම්
බෝතලයක් රු. 640 බැගින් විනාකිරි බෝතල් 10 යි.
බෝතලයක් රු. 650 බැගින් පොල්තෙල් බෝතල් 20 යි.

03/28 රක්ෂණ වාරිකය චෙක්පතකින් ගෙව්වා රු. 6,000

03/30 3/20 දින තැන්පත් කළ චෙක්පත අගරු වුනා.

ඉහත ගනුදෙනු ඇසුරෙන්,

අ. 2024 මාර්තු මාසය සඳහා බැංකු ගිණුම

ආ. 2024 මාර්තු මාසය සඳහා ගැණුම් ජනලය පිළියෙල කරන්න.

(ලකුණු 08 යි)

**(මුළු ලකුණු 12 යි)**

05. (i) පහත දැක්වෙනුයේ කමල්සිරිගේ ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසයේ සිදුවු සුළු වියදම් පිළිබඳ විස්තරයකි.

| | | |
|---|---|---|
| 2024.01.01 | ප්‍රධාන මුදල් පාලකගෙන් ලැබුන මුදල | රු. 4,000 |
| 01.03 | ගමන් වියදම් ගෙවීම | රු. 175 |
| 01.06 | තැපල් ගාස්තු | රු. 270 |
| 01.13 | විදුලි පණිවිඩ | රු. 140 |
| 01.16 | යතුරු ලියන රිබන් | රු. 130 |
| 01.21 | යතුරු ලියන කඩදාසි | රු. 250 |
| 01.23 | ගමන් ගාස්තු | රු. 30 |
| 01.25 | මුද්දර හා ලිපි | රු. 75 |
| 01.28 | සුනිල්ට ගෙවීම් | රු. 500 |
| 01.29 | සංග්‍රහ වියදම් | රු. 250 |
| 01.30 | කාර්යාලයට පුටු දෙකක් ගත්තා | රු. 800 |

ගමන්, තැපල්, ලිපිද්‍රව්‍ය හා විවිධ වියදම් යන ලෙජර තීරු ද සහිත අග්‍රිම ක්‍රමයට සකස් කළ සුළු මුදල් පොතක එම ගනුදෙනු ලියා සුළු මුදල් පොත තුලනය කර දක්වන්න. (ලකුණු 06 යි)

(ii) තාරකාගේ ව්‍යාපාරයේ 2024 ජූනි මාසයේ ව්‍යාපාරය සඳහා පිළියල කරන ලද බැංකු ගිණුම හා බැංකුව විසින් එවන ලද බැංකු ගිණුම් විස්තරය පහත දී ඇත.

**බැංකු ගිණුම**

| | | | | | |
|---|---|---|---|---|---|
| 6/1 | ශේෂය ඉ/ගෙ | 85,700 | 6/5 | රක්ෂණය (120240) | 8,450 |
| 6/3 | මුදල් තැන්පතු | 15,000 | 6/12 | ජල බිල් (120241) | 1,670 |
| 6/8 | චෙක් තැන්පතු (200110) | 17,000 | 6/15 | සේවක වැටුප් (120242) | 16,000 |
| 6/9 | මුදල් තැන්පතු | 12,500 | 6/20 | ණයහිමියෝ (120243) | 9,400 |
| 6/28 | චෙක් තැන්පතු (310411) | 3,600 | 6/28 | විදුලි ගාස්තු (120244) | 3,700 |
| 6/29 | චෙක් තැන්පතු (411218) | 8,300 | 6/29 | ණයහිමි (120245) | 24,300 |
| | | | 6/30 | ශේෂය ප/ගෙ | 78,580 |
| | | 142,100 | | | 142,100 |
| 7/01 | ශේෂය ඉ/ගෙ | 78,580 | | | |

**2024 ජූනි මාසයේ බැංකු ගිණුම් විස්තරය**

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 2024/6/01 | ශේෂය ඉ/ගෙ | | | 85,700 |
| 6/03 | මුදල් තැන්පතු | | 15,000 | 100,700 |
| 6/05 | ස්ථාවර නියෝග-ණය වාරික | 18,450 | | 82,250 |
| 6/07 | චෙක් (120240) | 8,450 | | 73,800 |
| 6/09 | මුදල් තැන්පතු | | 12,500 | 86,300 |
| 6/12 | චෙක් (200110) | | 17,000 | 103,300 |
| 6/15 | චෙක් (120241) | 1,670 | | 101,630 |
| 6/18 | චෙක්පොත් ගාස්තු | 860 | | 100,770 |
| 6/19 | ණයගැති ප්‍රේෂණ | | 13,000 | 113,770 |
| 6/20 | චෙක් (120242) | 16,000 | | 97,700 |
| 6/25 | චෙක් (120243) | 9,400 | | 88,370 |

**අවශ්‍ය වන්නේ,**

අ. 2024 ජූනි 30 දිනට සංශෝධිත බැංකු ගිණුම

ආ. 2024. ජූනි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න. (ලකුණු 06 යි)

**(මුළු ලකුණු 12 යි)**

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර

විසින් සම්පාදිත යි.